# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.29 පැය 1300 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1903 /2024 විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. කේරළ ගංජා සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2024.12.28 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අනුරාධපුර පොලිස් වසමේ හල්පාන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා ග්‍රෑම් 32 මිලි ග්‍රෑම් 72 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අනුරාධපුර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනුරාධපුර පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිණිඅවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2024.12.28 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ තෝනිතට්ටමඩු ප්‍රදේශයේදී වැටලීම් දෙකක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 48 හා 51 වයස් වල පසුවන කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වාකරේ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **කේරළ ගංජා සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුර.**

2024.12.28 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අළුත්ගම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අළුත්ගම පොලිස් වසමේ ගනේගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා ග්‍රෑම් 110 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අළුත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ ගනේගම, අළුත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අළුත්ගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුර.**

2024.12.28 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ත්‍රිකුණාමලය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කින්නියා පොලිස් වසමේ ඊච්චන්තිව් ප්‍රදේශයේදී බලපත්‍ර නොමැතිව ටිපර් රථයකින් වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු වැලි කියුබ් 03 ක් සහිත ටිපර් රථයක් ද සමඟ අත්අඩංගුවට ගෙන කින්නියා පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වූ කින්නියා ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කින්නියා පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**